කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2024

2026 - අප්‍රේල්

**BCOME 1035 – මූල්‍ය ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : පහයි (05) කාලය : පැය 03 යි

A කොටස අනිවාර්ය වේ.

B කොටසින් ඕනෑම ප්‍රශ්න තුනක් (03) තෝරාගන්න.

---

**A කොටස**

**ප්‍රශ්න අංක - 01**

අ) LKAS 1 – මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතියට අනුව පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

i. අඛණ්ඩ පැවැත්ම සංකල්පය
ii. උපචිත සංකල්පය

(ලකුණු 2 x 02 = 04)

ආ) LKAS 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතිය යටතේ වත්කම් සහ වගකීම් ජංගම (Current) හෝ ජංගම නොවන (Non-current) ලෙස වර්ගීකරණය කිරීමට භාවිතා කරන නිර්ණායක පැහැදිලි කරන්න. ඔබේ පිළිතුර සඳහා එක් එක් කාණ්ඩයට අවම වශයෙන් එක් උදාහරණයක් බැගින් ඉදිරිපත් කරන්න

(ලකුණු 03)

ඇ). මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පීය රාමුව (Conceptual Framework for Financial Reporting) තුළ දක්වා ඇති ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ (Qualitative Characteristics) නම් කර පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ඈ). අරුණ සහ බිම්සර අතුරු ව්‍යාපාරයේ (Athuru Enterprise) සමාන හවුල්කරුවන් වන අතර, ලාභ අලාභ 3:2 අනුපාතයට බෙදා ගන්නා චතුර සහ දමිත් හවුල්කරුවන් ලෙස සිටින මිතුරු ව්‍යාපාරය (Mithuru Enterprise) සමඟ ඒකාබද්ධ වීමට තීරණය කර ඇත. ඒකාබද්ධ වන දිනට හවුල් ව්‍යාපාර දෙකෙහි ස්වාධීන මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත පරිදි විය:

| විස්තරය | අතුරු (රු.) | මිතුරු (රු.) | විස්තරය | අතුරු (රු.) | මිතුරු (රු.) |
|---|---|---|---|---|---|
| **ප්‍රාග්ධන ගිණුම්:** | | | **වත්කම්:** | | |
| අරුණ | 800,000 | - | ඉඩම් | 1,000,000 | 1,200,000 |
| බිම්සර | 800,000 | - | ගොඩනැගිලි | 750,000 | 765,000 |
| චතුර | - | 1,013,000 | යන්ත්‍ර සූත්‍ර | 325,000 | - |
| දමිත් | - | 755,000 | ගෘහ භාණ්ඩ | 214,000 | 215,000 |
| **ජංගම ගිණුම්:** | | | තොග | 239,000 | 141,000 |
| අරුණ | 20,000 | - | ණයගැතියන් | 334,000 | 95,000 |
| බිම්සර | (13,000) | - | අතැති මුදල් | 20,000 | 80,000 |
| චතුර | - | - | | | |
| දමිත් | - | 10,000 | | | |
| | | | | | |
| ප්‍රත්‍යාගණන සංචිත | 150,000 | 234,000 | | | |
| බැංකු ණය | 850,000 | | | | |
| ණයහිමියන් | 425,000 | 484,000 | | | |
| **එකතුව** | **2,882,000** | **2,496,000** | **එකතුව** | **2,882,000** | **2,496,000** |

අතුරු ව්‍යාපාරය සහ මිතුරු ව්‍යාපාරය ඒකාබද්ධ වී **"අතුරු මිතුරු ව්‍යාපාරය"** (Athuru Mithuru Enterprise) නමින් නව ආයතනයක් පිහිටුවන ලදී.

**ඒකාබද්ධ වීමේ කොන්දේසි:**

i. නව ව්‍යාපාරය බැංකු ණය වගකීමක් ලෙස භාර නොගනී. ඒ සඳහා ප්‍රමාණවත් මුදල් නොමැති බැවින් අරුණ සහ බිම්සර එම ණය වගකීම භාර ගනී.

ii. මිතුරු ව්‍යාපාරයේ ගෘහ භාණ්ඩ චතුර විසින් භාර ගනු ලැබේ.

iii. නව ආයතනය විසින් වත්කම් හා වගකීම් භාර ගන්නා අගයන්:

| | අතුරු | මිතුරු |
|---|---|---|
| **ඉඩම්** | රු. 1,500,000 | රු. 1,450,000 |
| **ගොඩනැගිලි** | රු. 710,000 | රු. 732,000 |
| **යන්ත්‍ර සූත්‍ර** | රු. 410,000 | - |
| **ගෘහ භාණ්ඩ** | රු. 220,000 | - |
| **තොග** | රු. 243,000 | රු. 137,000 |

iv. අනෙකුත් වත්කම් සහ වගකීම් නව ආයතනය විසින් පොත් අගයයන් යටතේ භාර ගනු ලැබේ.

v. ඒකාබද්ධ කිරීම සඳහා අතුරු සහ මිතුරු ව්‍යාපාරවල කීර්තිනාමය (Goodwill) පිළිවෙලින් රු. 300,000 සහ රු. 500,000 ලෙස තක්සේරු කර ඇති අතර, නව ආයතනය එය සිය ගිණුම් පොත්වල පෙන්විය යුතුය.

vi. අරුණ, බිම්සර, චතුර සහ දමිත් අතර නව ලාභ අලාභ බෙදා ගැනීමේ අනුපාතය පිළිවෙලින් 2:2:1:1 වේ.

vii. නව ආයතනයේ මුළු ප්‍රාග්ධනය රු. 6,000,000 විය යුතු අතර එය හවුල්කරුවන්ගේ ලාභ බෙදා ගැනීමේ අනුපාතයට අනුකූල විය යුතුය. අතිරික්ත හෝ ඌනතාවයන් හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හරහා පියවිය යුතුය.

**ඉහත තොරතුරු භාවිතා කර ඔබ විසින් පිළියෙල කළයුතු වන්නේ,**

1. අතුරු ව්‍යාපාරයේ සහ මිතුරු ව්‍යාපාරයේ මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨාව (Purchase Considerations) ගණනය කිරීම

(ලකුණු 06)

2. අතුරු ව්‍යාපාරයේ සහ මිතුරු ව්‍යාපාරයෙහි ගිණුම් පොත් වෙන වෙනම වසා දැමීම

(ලකුණු 14)

3. "අතුරු මිතුරු ව්‍යාපාරයේ" මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීම

(ලකුණු 05)

**(මුළු ලකුණු 40 යි)**

**B කොටස**

**ප්‍රශ්න අංක 02**

අ) LKAS 2 - තොග (Inventories) ප්‍රමිතියට අනුව 'තොග' යන්න අර්ථ දක්වන්න.

(ලකුණු 03)

ආ) LKAS 2 - තොග (Inventories) ප්‍රමිතිය යටතේ හඳුනාගනු ලබන විවිධ තොග පිරිවැය වර්ග (inventory costs) මොනවාද?

(ලකුණු 03)

ඇ) XYZ නිෂ්පාදන (පුද්) සමාගම වසර තුළ පහත සඳහන් පිරිවැය දරා ඇත:

i. අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ මිල - රු. 500,000
ii. ලැබුණු වෙළඳ වට්ටම් - රු. 40,000
iii. ආපසු නොගෙවන ආනයන බදු - රු. 20,000
iv. ප්‍රවාහන හා හසුරුවන පිරිවැය - රු. 8,000
v. ඍජු ශ්‍රම පිරිවැය - රු. 300,000
vi. කර්මාන්තශාලා පොදු කාර්ය පිරිවැය (නිෂ්පාදනයට අදාළ) - රු. 90,000
vii. අසාමාන්‍ය ද්‍රව්‍ය නාස්තිය - රු. 35,000
viii. විකුණුම් හා බෙදාහැරීමේ වියදම් - රු. 50,000
ix. පරිපාලන වියදම් (නිෂ්පාදනයට අදාළ නොවන) - රු. 45,000
x. විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (උදා: විදුලිය) - රු. 15,000

LKAS 2 ප්‍රමිතියට අනුකූලව, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු තොගවල මුළු පිරිවැය ගණනය කරන්න.

(ලකුණු 10)

ඈ) සමාගමක් සතුව වර්ෂය - අවසානයේ තොග ඒකක 60 ක් ඇත.

- ඒකකයක පිරිවැය - රු. 3,000
- ඒකකයක ඇස්තමේන්තුගත විකුණුම් මිල - රු. 3,200
- නිම කිරීමට යන ඇස්තමේන්තුගත පිරිවැය (ඒකකයකට) - රු. 150
- ඇස්තමේන්තුගත විකුණුම් වියදම් (ඒකකයකට) - රු. 100

LKAS 2 ප්‍රමිතියට අනුව අවසන් තොගයේ අගය ගණනය කරන්න.

(ලකුණු 04)
**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) LKAS 16 ප්‍රමිතියට අනුව දේපළ, පිරියත සහ උපකරණ (PPE) අර්ථ දක්වන්න.

(ලකුණු 04)

ආ) දේපළ, පිරියත සහ උපකරණවල ආරම්භක මිනුම්කරණයට (Initial Measurement) ඇතුළත් වන පිරිවැය මොනවාද?

(ලකුණු 06)

ඇ) යන්ත්‍රෝපකරණ ඒකකයක ධාරණ අගය (Carrying amount) රු. 2,500,000 කි. වසර තුළ එය ප්‍රත්‍යාගණනය කළ අතර එහි සාධාරණ අගය රු. 3,100,000 දක්වා වැඩි විය. මීට පෙර, මෙම වත්කමට අදාළව රු. 200,000 ක ප්‍රත්‍යාගණනය අඩුවීමක් ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනාගෙන තිබුණි. මෙම ප්‍රත්‍යාගණනය වැඩිවීම සඳහා වන ගිණුම්කරණ ප්‍රතිකර්ම පැහැදිලි කර එය මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කළ යුතු ආකාරය පෙන්වන්න.

(ලකුණු 05)

ඈ) LKAS 16 ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් කළ යුතු අනාවරණ අවශ්‍යතා (Disclosure requirements) පැහැදිලි කරන්න.

(ලකුණු 05)
**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

අ) LKAS 23 – ණය ගැනීමේ පිරිවැය ප්‍රමිතියට අනුව පහත සංකල්ප පැහැදිලි කරන්න.

i. ණය ගැණුම් පිරිවැය (Borrowing Costs)
ii. සුදුසුකම් ලබන වත්කම් (Qualifying Assets)

(ලකුණු 2 x 02 = 04)

ආ) LKAS 23 – ණය ගැනීමේ පිරිවැය ප්‍රමිතියට අනුකූලව ආයතනයක් විසින් ණය ගැනීමේ පිරිවැය සම්බන්ධයෙන් පහත ක්‍රියාවන් සිදු කළ යුත්තේ කවදාදැයි පැහැදිලි කරන්න.

i. ප්‍රාග්ධනීකරණය ආරම්භ කිරීම (Commence Capitalization)
ii. ප්‍රාග්ධනීකරණය තාවකාලිකව නැවැත්වීම (Suspend Capitalization)
iii. ප්‍රාග්ධනීකරණය නතර කිරීම (Cease Capitalization)

(ලකුණු 02 x 3 = 06)

ඈ) ආලෝක සමාගම නව නිෂ්පාදන කම්හලක් ඉදිකිරීම සඳහා 2025 අප්‍රේල් 1 දින වාණිජ බැංකුවකින් 12% ක වාර්ෂික සරල පොලී අනුපාතයක් යටතේ රු. 2,000,000 ක ණය මුදලක් ලබා ගත්තේය. අරමුදල් පහත පරිදි භාවිතා කරන ලදී:

- රු. 1,200,000 ක් වහාම කම්හලේ ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගන්නා ලදී.
- ඉතිරි රු. 800,000 අවශ්‍ය වන තෙක් වාර්ෂිකව 8% ක පොලියක් උපයන ස්ථාවර තැන්පතුවක තාවකාලිකව ආයෝජනය කරන ලදී.
- කම්හලේ ඉදිකිරීම් 2025 දෙසැම්බර් 31 දින අවසන් වූ අතර, එම දිනය වන විට කම්හල එහි අපේක්ෂිත භාවිතය සඳහා සූදානම්ව තිබුණි.
- තාවකාලික ආයෝජනය 2025 දෙසැම්බර් 31 දින ආපසු ලබාගෙන කොන්ත්‍රාත්කරුට ගෙවන ලදී.
- සමාගම 2026 අප්‍රේල් 1 දින නව පිරියතින් වාණිජ නිෂ්පාදන කටයුතු ආරම්භ කළේය.

ඔබ විසින් පහත දෑ ගණනය කළයුතුය.

i. ප්‍රාග්ධනීකරණය කළ යුතු ණය ගැනීමේ පිරිවැය ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 04)

ii. LKAS 23 – ණය ගැණුම් පිරිවැය ප්‍රමිතියට අනුකූලව, 2026 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වියදමක් ලෙස හඳුනාගත යුතු මුදල ගණනය කරන්න.

(ලකුණු 03)

iii. 2026 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ 2026 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ අදාළ උපුටා ගැනීම් දක්වන්න.

(ලකුණු 03)
**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

අ) SLFRS 16 - බදු (Leases) ප්‍රමිතියට අනුව “බදු” (Lease) යන පදය පැහැදිලි කරන්න.

(ලකුණු 02)

ආ) SLFRS 16 - බදු ප්‍රමිතිය යටතේ පවතින හඳුනාගැනීම් නිදහස් කිරීම් (Recognition exemptions) සඳහන් කර පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඈ) කල්බදු ගැණුම්කරුගේ දෘෂ්ටිකෝණයෙන් (Lessor's perspective), කල්බදු ගිවිසුම් මූල්‍ය කල්බදු(Finance leases) හෝ මෙහෙයුම් කල්බදු (Operating leases) ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මෙම වර්ගීකරණය, එම වර්ග දෙක අතර පැහැදිලි වෙනස දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඇ) ප්ලැටිනම සමාගම 2025 අප්‍රේල් 1 දින යන්ත්‍රෝපකරණ ලබා ගැනීම සඳහා කල්බදු ගිවිසුමකට එළඹුණි. පහත තොරතුරු ලබා දී ඇත.

- 2025 අප්‍රේල් 1 දින මූලික ගෙවීම: රු. 100,000
- වාර්ෂික කල්බදු ගෙවීම්: රු. 70,000 බැගින් වසර 4 ක් සඳහා වසර අවසානයේදී ගෙවිය යුතුය (පළමු ගෙවීම 2026 මාර්තු 31 දින).
- බදු කාලය අවසානයේ ගෙවිය යුතු සහතික කළ අවශේෂ අගය: රු. 15,000
- බදුකරු විසින් දැරූ මූලික සෘජු පිරිවැය: රු. 25,000
- බදු ගිවිසුමෙහි අන්තර්ගත වාර්ෂික පොලී අනුපාතය: 10%

ඔබ විසින් පහත දෑ ගණනය කළයුතුය.

i. කල්බදු ආරම්භක දිනයේ පවතින කල්බදු වගකීම (Lease liability) ගණනය කරන්න.

(ලකුණු 02)

ii. භාවිත කිරීමේ අයිතිය සහිත වත්කම් (Right-of-use asset) ලෙස හඳුනාගත යුතු මුදල ගණනය කරන්න.

(ලකුණු 04)

iii. 2026 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ප්ලැටිනම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල අදාළ උපුටා ගැනීම් දක්වන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**